## ඇමුණුම 5

## දරුවන්ගේ මිනුම් නිවැරදිව වාර්තා කිරීම

**පියවර 1 - පාඨාංකය දරුවාගේ සෞඛ්‍ය වර්ධන සටහනෙහි B කොටසෙහි සටහන් කිරීම**

බර නිවැරදිව කිරා ආසන්නතම ග්‍රෑමයට වර්ධන සටහනෙහි අදාල තීරයෙහි සටහන් කරන්න. උස ආසන්නතම මිලිමීටරයට අදාල තීරයෙහි සටහන් කරන්න.

**පියවර 2 - දරුවාගේ සෞඛ්‍ය වර්ධන සටහනෙහි A කොටසෙහි ප්‍රස්ථාර ගතකිරීම**

දරුවාගේ සෞඛ්‍ය වර්ධන සටහනෙහි A කොටසෙහි

- වර්ධන ප්‍රස්ථාරයන්හි නිවැරදිව බර සහ දිග/උස පාඨාංක ප්‍රස්ථාර ගත කරන්න.
- ළමයා ක්‍රමවත්ව වර්ධනය මැන බැලීම සඳහා පැමිණ ඇත්නම් නම් බර සහ දිග/උස සළකුණු කිරීම් දෙකක් සරල රේඛාවක් මගින් යා කරන්න.
- අක්‍රමවත් ලෙස වර්ධනය මැන බැලීම සඳහා පැමිණි දරුවකු නම් බර සහ දිග/උස සලකුණු කිරීම් තිත් ඉරකින් යාකරන්න.

**පියවර 3 - වර්ධන තත්ත්වයට අදාළ කේත ලකුණ සටහන් තැබීම (A හා B කොටස්වල)**

දරුවාගේ සෞඛ්‍ය වර්ධන සටහනෙහි A කොටසෙහි වර්ධන ප්‍රස්ථාරයෙහි දී ඇති සම්මත වර්ධන රේඛාවලට සාපේක්ෂව දරුවාගේ වර්ධන තත්ත්වය නිවැරදිව හඳුනා ගත යුතුවේ. ඉන්පසු එයට අදාළ කේත අකුර පහත පරිදි සටහන් කළ යුතුය. මිනුම ගන්නා නිළධාරිණිය විසින් මිනුමක් ගන්නා සෑම වාරයකදීම කේත අකුර B කොටසේ සටහන් කළ යුතු අතර සායන වාරයකදී නම් A කොටසේ ළමා සෞඛ්‍ය සටහනේද අදාළ පැමිණීම් දිනය යටතේ සටහන් කළ යුතුය.

**වයසට අදාළ බර රේඛාව**

| **වර්ධන රේඛාවේ රටාව** | **වර්ධන තත්ත්වය** | **කේත අකුර** |
|---|---|---|
| කොලපැහැති කලාපය/ලා කොළ පැහැති කලාපය* තුල සම්මත වර්ධන රේඛාවට සමාන්තරව වර්ධනය සිදුවීම | නියමිත වර්ධනය | N |
| කොලපැහැති කලාපය/ලා කොළ පැහැති කලාපය තුල කිරුම් වාර දෙකක් අතර<br>- බර වැඩි වන නමුත් අපේක්ෂිත පරිදි (දරුවාගේ උපත් බරට අනුව) ප්‍රමාණවත් නොවීම<br>- බර වැඩි නොවීම<br>- බර අඩු වීම | වර්ධනය අඩාල වීම**<br>(නියමිත වර්ධන කලාපය තුල වර්ධනය අඩාළ වීම) | NO |

| | | |
|---|---|---|
| තැඹිලි කලාපය තුල සම්මත වර්ධන රේඛාවලට සමාන්තරව වර්ධනය සිදුවීම | මධ්‍යස්ථ අඩු බර | X |
| තැඹිලි කලාපය තුල කිරුම් වාර දෙකක් අතර<br>- බර වැඩි වන නමුත් අපේක්ෂිත පරිදි (දරුවාගේ උපත් බරට අනුව) ප්‍රමාණවත් නොවීම<br>- බර වැඩි නොවීම<br>- බර අඩු වීම | වර්ධනය අඩාල වීම**<br>(මධ්‍යස්ථ අඩුබර කලාපය තුල වර්ධනය අඩාළ වීම) | XO |
| තද රතු කලාපය තුල සම්මත වර්ධන රේඛාවට සමාන්තරව වර්ධනය සිදුවීම | උග්‍ර අඩු බර | XX |
| තද රතු කලාපය තුල කිරුම් වාර දෙකක් අතර<br>- බර වැඩි වන නමුත් අපේක්ෂිත පරිදි (දරුවාගේ උපත් බරට අනුව) ප්‍රමාණවත් නොවීම<br>- බර වැඩි නොවීම<br>- බර අඩු වීම | වර්ධනය අඩාල වීම**<br>(උග්‍ර අඩුබර කලාපය තුල වර්ධනය අඩාළ වීම) | XXO |
| දම් පැහැති කලාපය | "අධි බර" | OW |
| කොලපාට කලාපය තුල වර්ධන රේඛාව සම්මත රේඛාවන් කපාගෙන සීඝ්‍රයෙන් ඉහල යෑම*** | "අධි බර" | OW |

* ලා කොළ පැහැති පරාසය - මෙම කලාපයේ සිටින දරුවකුගේ වර්ධනය අඩාල වුවහොත් අඩුබර කලාපයට ගමන් කිරීමේ අවදානම වැඩි නිසා වර්ධන රේඛාව නිසි පරිදි පවත්වා ගැනීමට නිරන්තර අවධානය යොමු කළ යුතුය.

** වර්ධනය අඩාල වී ඇති දරුවකු තමා මුලදී ගමන් කල වර්ධන රේඛාවට යළි පැමිණෙන තෙක්ම එය වර්ධනය අඩාලවීමක් හැටියට වාර්තා කල යුතුය.

*** වර්ධනය අඩාලවූ දරුවකුගේ නිසි මැදිහත්වීමෙන් පසු ඇතිවන ඉක්මන් බර වැඩිවීම (catch up growth) හැර වෙනත් අවස්ථා

**වයසට අදාළ දිග/උස රේඛාව**

| **වර්ධන රේඛාවේ රටාව** | **වර්ධන තත්ත්වය** | **කේත අකුර** |
|---|---|---|
| කොලපැහැති කලාපය/ලා කොළ පැහැති කලාපය* තුල වර්ධන රේඛාවලට සමාන්තරව වර්ධනය සිදුවීම | නියමිත වර්ධනය | NH |
| තැඹිලි කලාපය තුල පවතින වර්ධන රේඛාව | මධ්‍යස්ථ මිටි බව | S |
| තද රතු කලාපය තුල පවතින වර්ධන රේඛාව | උග්‍ර මිටි බව | SS |

*ලා කොළ පැහැති පරාසය - මෙම කලාපයේ සිටින දරුවකුගේ දිග/උසෙහි වර්ධනය අඩාල වුවහොත් ක්‍රමයෙන් මධ්‍යස්ථ මිටි කලාපයට ගමන් කිරීමේ අවදානම වැඩි නිසා වර්ධන රේඛාව නිසි පරිදි පවත්වා ගැනීමට නිරන්තර අවධානය යොමු කළ යුතුය.

අදාල මාසය තුළ බර/දිග/උස කිරීම සඳහා නොපැමිණියේ නම් A ලෙස සටහන් කරන්න.

**නොමේරූ ළදරුවන් සඳහා වර්ධක දර්ශක අර්ථකතනය කිරීම**

සෑම නොමේරූ ළදරුවකුගේම වර්ධනය ඇගයීමෙන් පසු වෛද්‍යවරයා වෙත යොමුකර වර්ධන තත්ත්වය නිවැරදි ලෙස අර්ථකතනය කරගැනීම අත්‍යවශ්‍යය.

සෑම නොමේරූ ළදරුවෙකුගේම මිනුම්, සම්මත රේඛාවන් හා සැසඳීමේදී වෛද්‍යවරයා විසින් නිවැරදි කරනලද වයසට අනුරූපව අර්ථකතනය කළයුතුයි. සති 37ට පෙර ඉපදුන ළදරුවන් සඳහා කලින් ඉපදුනු සති ගණන දැන් වයසින් අඩු කර වයස ගණනය කළ යුතුයි.

උදා - සති 32දී (එනම් නියමිත දිනට සති 8කට පෙර) උපන් ළදරුවකු උපතින් මාස 5කට පසු පැමිණේනම් එම ළදරුවාගේ දැනට වයස මාස 5 ලෙස නොව මාස 3 ලෙස සලකා (මාස 5 - සති 8 = මාස 3) වර්ධන ප්‍රස්ථාර අර්ථකතනයකර නියම වර්ධන තත්ත්වය පිළිබඳව අවබෝධ කරගත යුතුය.

(පොදු චක්‍රලේඛ ලිපි අංක 02-18/2008 - "Protocol for managing nutritional problems among under 5 children in community" බලන්න).

දරුවාට මාස 6ක් සම්පූර්ණ වන තෙක් /ළමා වෛද්‍ය විශේෂඥවරයකු විසින් තීරණය කරන තෙක්, එසේ නිවැරදි කළ වයසට අනුරූපව වෛද්‍යවරයකු විසින් මිනුම් අර්ථකතනය කළ යුතුය. ඉන් පසු සාමාන්‍ය පරිදි වයසට අදාළ බර අර්ථකතනය කරනු ලැබේ.

මිනුම් සටහන් වාර්තා තැබීමෙන් පසු දරුවාගේ සෞඛ්‍ය වර්ධන සටහනෙහි B කොටසෙහි දරුවාගේ වර්ධන සටහන් පිටුවකට උදාහරණයක් පහත දක්වා ඇත.

## දරුවාගේ වර්ධන සටහන

උපත් බර ......3.2 kg..... උපතේදී දිග ....48.5 cm...

| දිනය | | | පෝෂණ තත්වය | | | | | ත්‍රිපෝෂ ලබාදුන් දිනය | | | කරන ලද මැදිහත්වීම් පිළිබඳ සටහන |
|---|---|---|---|---|---|---|---|---|---|---|---|
| | | | බර | | | උස | | දි | මා | ව | |
| දි | මා | ව | කි.ග්‍රෑ | නියමිත බර/අධිබර /අඩුබර/උග්‍ර අඩුබර | වර්ධනය අඩාලවීම | සෙ.මී | දිග/උස තත්ත්වය | | | | |
| 10 | 10 | 09 | 3.8 | N | - | - | - | | | | |
| 12 | 11 | 09 | 4.7 | N | - | | | | | | |
| 14 | 12 | 09 | 5.5 | N | - | | | | | | |
| 12 | 01 | 10 | 6.2 | N | - | 62 | N | | | | |
| 15 | 02 | 10 | 6.8 | N | - | | | | | | |
| 10 | 03 | 10 | 7.5 | N | 0 | | | | | | නිවැරදි ආහාර රටාව පිළිබඳව උපදෙස් දෙන ලදී. |
| 15 | 04 | 10 | 7.6 | N | 0 | | | 18 | 04 | 10 | |
| 12 | 06 | 10 | 7.6 | N | 0 | | | 20 | 06 | 10 | |
| 20 | 07 | 10 | 8.1 | N | 0 | 72.5 | N | | | | යොමු කළෙමි. |
| 10 | 10 | 10 | 7.5 | N | 0 | | | 15 | 10 | 10 | |
| 15 | 02 | 11 | 7.7 | X | 0 | | | 19 | 02 | 11 | |
| 15 | 04 | 11 | 8 | X | 0 | 82 | N | | | | හමුවී නැත. යළි උපදෙස් දුනිමි. |